සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

Resource Centre R De Mazenod College Kandana

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
Year End Evaluation - 2024 (2025)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 යි |

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................

සැලකිය යුතුයි.

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40ක් හිමි වේ.
ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන උත්තරය තෝරන්න.
iii. ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත්.උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
iv. එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

---

- අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.

01. රාජකාරි ජීවිතයේ දී **ඉස්පාසුවක්** නොමැති වුව ද කාර්යාල සහායකයා සතුටින් සිටියේ ය.
1. පහසුවක් 2. විවේකයක් 3. යහපතක් 4. මහන්සියක්

02. අසල්වැසි නිවසේ සිදුවූ සොරකම ගැන **හාංකවිසියක්** නොදන්නා බව සාක්ෂිකරු කියා සිටියේ ය.
1. සත්‍ය තොරතුරක් 2. ස්ථිර ව යමක් 3. කිසිදු තොරතුරක් 4. සුළු තොරතුරක්

03. ගමට පැමිණි **වෙළෙන්දා අං ගිලපු පුද්ගලයෙකු** බව කවුරුත් පැවසූහ.
1. අවංක පුද්ගලයෙක් 2. බොරු කාරයෙකු
3. බියෙන් සිටින පුද්ගලයෙකු 4. ඉතා කපටි පුද්ගලයෙකු

- අංක 04 සිට 06 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

04. ජනකවිය ප්‍රබුද්ධ කවියේ පවා නැති රස ජනනය කිරීමේ ........................ හිමිකරගෙන ඇත.
1. යෝග්‍යතාවක් 2. අවශ්‍යතාවක් 3. ශක්‍යතාවක් 4. නව්‍යතාවක්

05. දක්ෂ ලේඛකයෝ භාෂාවේ විවිධ ස්වරූප ................................ කරමින් උසස් නිර්මාණ සමාජයට ඉදිරිපත් කරති.
1. සුසංයෝජනය 2. සංවිධානය 3. සංක්ෂිප්ත 4. සහජීවනය

06. රටක පැවැත්වෙන උත්සව, චාරිත්‍ර ආදිය එම රටේ වසන ජනයාගේ .................. පිළිබිඹු කරන කැටපතක් බඳු ය.
1. අනන්‍යතාව 2. අවශ්‍යතාව 3. හැකියාව 4. අනන්‍යතාව

07. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
1. විශිෂ්ඨ, සම්පාධනය, ගාම්බීර, ප්‍රාදූර්භූත 2. අනුකරනය, ඊශ්වර, ආකර්ෂණය, සමීක්ෂණය
3. තෘෂ්ණාව, පිළිසකර, ප්‍රස්තාවනාව, අභිලාෂය 4. දෘෂ්ඨිගෝචර, මාධූර්‍ය්‍යය, ප්‍රහර්ෂය, කොට්ඨාශය

08. අකාරාදි පිළිවෙළට වචන යෙදී ඇති වරණය තෝරන්න.
1. කටුපොත, කඩවත, කතරගම, කහපොළ 2. නාවලපිටිය, ඔක්කම්පිටිය, ඇල්පිටිය, කුලියාපිටිය
3. මාරස්සන, මාරවිල, මල්වාන, මාවරල 4. කිතුල්ගල, කඩුවෙල, දඹදෙණිය, දියතලාව

09. දීර්ඝ පාපිල්ල, කෙටි ඇදපිල්ල, කෙටි පාපිල්ල, ඇලපිල්ල යන පිල්ලම් පිළිවෙළින් යෙදුණු වචන සහිත වරණය තෝරන්න.
1. ගැරුප්පු, අකුසල, විරල, මැදියම 2. රූඩී, මැඳුර, බුරුමය, තාපය
3. සීමාව, පැරණි, මාලය, සුරත් 4. මීදුම, අරුමය, වාදනය, දැහැමි

10. ච, ඡ, ජ, ඣ, ඤ යන අක්ෂර වර්ගය අයත් වන පිළිතුර තෝරන්න.
1. දන්තජ 2. මූර්ධජ 3. නාසිකා 4. තාලුජ

11. මුලින් දැක්වෙන පදයට සමානාර්ථ නොදෙන පදය සහිත පද පේළිය තෝරන්න.
1. නිපුණ : ප්‍රවීණ, විදග්ධ, හසළ, වියත් 2. අලංකාර : විචිත්‍ර, මනකල්, ශෝභන, මනහර
3. පාද : පා, සරණ, චරණ, වරණ 4. සුරරද : ශක්‍රයා, පුරඳුරු, සහසැස්, සුරරජ

12. මුල් පදයට විරුද්ධාර්ථය දෙන පදය ඇතුළත් වරණය තෝරන්න.
1. අභිවෘද්ධිය - ප්‍රගමනය 2. සංකෝචනය - විස්තාරණය
3. සංවේගය - කනගාටුව 4. අඥාන - මූඪ

13. යුගල පදයක් අන්තර්ගත නොවන පද පේළිය තෝරන්න.
1. යාන වාහන, අතන මෙතන, ඉඩම් කඩම්, පඩි නඩි 2. යන එන, උඩ යට, බාල මහලු, පින් පව්
3. වැර වැයම්, වස විස, තරණ තිමිර, වැහි වරුසා 4. පොතපත, දුගී මගී, වතුපිටි, දැනඋගත්

- 1. අයියා වැඩට ගොස් ගෙදර ආවේ ය.
2. සඳරැස් වැටෙත කුමුදු වනය විකසිත වෙයි.
3. උපාසිකාව බුදුන් වැඳ භාවනා කළා ය.
4. බල මහ මුහුද එම සඳ උතුරින් පෙනෙන

14. ඉහත වාක්‍ය අතුරෙන් අසම්භාව්‍ය ක්‍රියාවක් හා විධි ක්‍රියාවක් ඇතුළත් වාක්‍ය වන්නේ,
1. 2 හා 4 ය. 2. 1 හා 3 ය. 3. 1 හා 2 ය. 4. 2 හා 3 ය.

15. වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.
1. සඤ්ඤක අක්ෂර අඝෝෂ අක්ෂර කාණ්ඩයට අයත් වේ.
2. නිපාත හා උපසර්ග අව්‍යය පද වේ.
3. ඓ, ඖ ස්වර සංයුක්ත ස්වර ගණයට අයත් වේ.
4. අර්ධ ස්වර සමග අනුගත වන ස්වර ශබ්ද ඇත.

16. මුලින් දී ඇති පද දෙකෙහි ම නිවැරදි විසන්ධිය දැක්වෙන වරණය තෝරන්න.
1. යථාවබෝධය, යසිසුරු - යථා+අවබෝධය, යසස්+ඉසුරු
2. ගෞරවාචාර, දංඕවිට - ගෞරව+ආචාර, දඹ+ඕවිට
3. එදිනෙදා, නිරවුල් - එදින්+නෙදා, නිර+අවුල්
4. කෘතෝපකාර, දැගසවු - කෘත්‍ය+උපකාර, දෑ+අගසවු

17. එක් එක් වාක්‍යයේ හිස්තැනට සුදුසු නිපාත අනුපිළිවෙළ තෝරන්න.
A ඖෂධ වැරදි .......................... භාවිත කිරීමෙන් විවිධ ආබාධ ඇති වේ.
B පාසලේ සංවර්ධනය ............................ දෙමාපියන්ගේ සහාය අවශ්‍ය බව විදුහල්පතිතුමා පැවසුවේ ය.
C ආයතන ප්‍රධානියා දුන් උපදෙස් ..................... ලිපිකරුවෝ ලිපිගොනු සකස් කළහ.
පරිසරය ......................... සොබාදහමේ අමිල දායාදයකි.
1. පරිදි, වනාහි, ලෙස, උදෙසා 2. වනාහි, පරිදි, ලෙස, උදෙසා
3. ලෙස, උදෙසා, පරිදි, වනාහි 4. උදෙසා, වනාහි, ලෙස, පරිදි

18. උපසර්ග පදයක් යෙදී නොමැති වරණය තෝරන්න.
1. අනුබල, දුසිරිත්, පබඳ, සුවිශාල 2. ප්‍රතිචාර, දුර්මත, සඵල, අපහරණය
3. අතියත, අවධාරණය, පරිවර්තනය, පිරිසිදු 4. නිර්දේශ, සාර්ථක, සම්මාන, පිළිසරණ

19. උක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
1. නායිකාවක, සත්තු, නුඹ, වීරයන්
2. මම, මවක, තරුණයෙක්, මිතුරෝ
3. ඔවුහු, නිලධාරීහු, වාදකයෙක්, ඕ
4. කවියන්, අයෙකු, දියණියක, නුඹලා

20. තද්ධිත පදයක් යෙදී නොමැති වරණය තෝරන්න.
1. කුසලතා
2. විවිධත්ව
3. බවලතා
4. දුර්වලතා

21. ප්‍රකෘතිය හා ප්‍රත්‍යය නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.
1. සුරන් - සුරු + අන්
2. මලෙහි - මල + එහි
3. දියණි - දූ + අණි
4. ලියන්නා - ලියන් + ආ

22. එක් එක් පදයේ අර්ථය නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.
1. ස්ථාපනය - පිහිටුවීම, අනූන - බොහෝ, කන්කටු - අමිහිරි, පුවළ - උසස්
2. අලු - භස්ම, වල - ආවාටය, කෘෂ්ණ - රළු, නුඹ - අහස
3. දිසි - බබළන, සම්වන් - සමාන, අතුළ - විසුරුණු, වාලධිය - වලිගය
4. ද්වාරය - මාවත, නුවණ - ඥානය, පශ්චාත් - පූර්ව, දූරිභූත - නරක

23. නිත්‍ය බහුවචන පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.
1. හේ, ඔහු, හෙතෙම, ඕ
2. ඇතමෙක්, සමහරෙක්, අයෙක්, කෙනෙක්
3. හාවා, ගොවීන්, සේවකයෝ, දරුවන්
4. මැණියෝ, දෑ, පියාණ, තෙරණි

- පහත දී ඇති එක් එක් වාක්‍යයේ කළු අකුරින් මුද්‍රිත කොටසෙහි අර්ථය ඇතුළත් පිළිතුර තෝරන්න.

24. කෝට්ටේ යුගයේ සන්දේශ කාව්‍යවලින් ගම්‍යමාන වන්නේ කවීන්ගේ විශිෂ්ට කවි ශක්තියයි.
1. දෘශ්‍යමාන වන්නේ
2. ඉස්මතු වන්නේ
3. ප්‍රකට වන්නේ
4. හැඟෙන්නේ

25. ලක්ෂ්මී හෙවත් ශ්‍රී කාන්තාව ක්ෂීර සාගරයෙන් ප්‍රාදූර්භූත වූ බව හින්දු ජනයා විශ්වාස කරති.
1. පැමිණි බව
2. මතු වූ බව
3. පහළ වූ බව
4.. විනාශ වූ බව

26. සිංහල රජවරුන්ගේ මුඛ්‍යාධාශය වූයේ සතුරු ආක්‍රමණවලින් රට ආරක්ෂා කර ගැනීමයි.
1. මූලික අරමුණ
2. අනුමානය
3. සම්ප්‍රදාය
4. උපක්‍රමය

27. එවන් ලෙයින් උපන් පුතේ
සුරු විරුකම් ඔබට ඇතේ
දෑ උරුමය ඇතිව සිතේ
..............................................

ඉහත කවියේ අවසාන පද පේළිය වන්නේ,
1. ඉදි කළ වැව් බලන් පුතේ
2. ඔබ පොළොවට බරකි පුතේ
3. මව්බිම දෙස බලන් පුතේ
4. ඒ මහ වැව් බැඳුණෙ පුතේ

28. අතීත කාල, මධ්‍යම පුරුෂ, කර්මකාරක බහුවචන, ක්‍රියාරූපය ඇතුළත් පිළිතුර කුමක් ද?
1. ලියන ලදහ.
2. ගයන ලද්දෙහු.
3. ගියෙහු
4. බලන ලදහි

29. නාම විශේෂණයක් නොමැති වාක්‍යය තෝරන්න.
1. තාත්තා ඉක්මනින් ගෙදර ආවේ ය.
2. විශිෂ්ට ලෝබකයේ සම්මාන ලැබූහ.
3. අධික වර්ෂාව නිසා කඳුකර ප්‍රදේශවල නායයෑම් සිදුවේ.
4. වන සත්තු දිය බීමට වැවට බැස්සෝ ය.

30. ක්‍රියා විශේෂණයක් නොමැති වාක්‍යය තෝරන්න.
1. අත්‍යවශ්‍ය භාණ්ඩ මිල ඉහළ යාම නිසා පාරිභෝගිකයෝ කනස්සල්ලෙන් සිටිති.
2. සංචාරකයෝ සීගිරි පර්වතය දෙස පුදුමයෙන් බැලුවෝ ය.
3. ආධුනික ගායකයෝ තරගයට ඉදිරිපත් වූහ.
4. නීතිඥයා විත්තිකරු දෙස විමසිල්ලෙන් බැලුවේ ය.

31. රූපකාලංකාරය ඇතුළත් පිළිතුර තෝරන්න.

1. හරිත වර්ණ තුරු ගොමුවෙන් සුසැදුණු
2. බැඳ හළ රතු ගලක් ලෙස සඳ වෙලෙන වට
3. දනමන නයන වශී කළ ලංකා
4. සුසුදු වලා කැරලි පලසකි මේ මග.දිග ඇතිරූ

● අංක 30 හා 31 ප්‍රශ්නවල මුලින් දී ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ ඇතුළත් වරණය තෝරන්න.

32. සියලු හොඳ සුළු වරදක් නිසා විනාශ වී යාම

1. කොටි වල්ගය අල්ලා ගත්තා වගේ
2. දෙබරයට ගල් ගැහුවා වගේ
3. කිරි කළයට ගොම බිංදුවක් දැම්මා වගේ
4. නයාට ගහලා පොල්ල වරද්ද ගත්තා වගේ

33. කිසියම් කාර්යයක් අපිළිවෙළට කිරීම

1. කුරුල්ලන්ට වැට බැන්දා වගේ
2. යකාගේ කටේ දත් හිටෙව්වා වගේ
3. වැල යන අතට මැස්ස ගහන්නා සේ
4. හිසරදේට කොට්ටෙ මාරු කරන්නා සේ

● අංක 34 සිට 35 තෙක් ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

34.
1. ඔවුන් සියල්ලෝ ම දක්ෂයෝ වෙති.
2. ඔවුහු නිවැරදි වන්නේ කවදා ද?
3. නායකයන් අවංක විය යුත්තෝ ය.
4. වෛද්‍යවරුන් රෝහලට පැමිණි ඇත.

35.
1. දරුවෝ දෙමාපියන්ට කීකරු විය යුතු ය.
2. සැඩ සුළඟින් ගෙවල් ද දොරවල් ද විනාශ වූහ.
3. ඕ තොමෝ සතුටින් වැඩ කළෝ ය.
4. ගුරුවරු සියලු දෙනා රැස්වීමට සහභාගි වූහ.

36. හේන් ගොවිතැනේ දී "අක් වැස්ස" නමින් හැඳින්වෙන්නේ,

1. හේන් කෙටීමට ප්‍රථම ලැබෙන වර්ෂාව යි.
2. හේන් ගිනි තැබීමෙන් පසු ලැබෙන ප්‍රථම වර්ෂාවයි.
3. හොඟ වගා කිරීමෙන් පසු ලැබෙන වර්ෂාව යි.
4. හේන් කෙටීමෙන් පසු ලැබෙන ප්‍රථම වර්ෂාව යි.

37. "කුඹුයොන් සයුරු බොත එහි මිණි සේ අනත"
මෙහි කුඹුයොන් යනුවෙන් හැඳින්වෙන්නේ,

1. විෂ්ණු දෙවියන් ය.
2. ඊශ්වර දෙවියන් ය.
3. අගස්ති සෘෂිවරයා ය.
4. බ්‍රහ්මයා ය.

38. "ඇතු ධූලින් වැසී ගිය ඇත් රජ යැ. මෑතු සවණක් ඝන බුදුරැසින් සැදී ගිය බුදුරජාණෝ ය."
ඉහත කොටස උපුටා ගත් සාහිත්‍ය ග්‍රන්ථය වන්නේ,

1. පූජාවලිය
2. බුත්සරණ
3. අමාවතුර
4. ජාතක පොත

39. අකීකරු පුත්‍රයෙකුගේ ලෝකය, සක්වා ලිහිණි යන සාහිත්‍යය නිර්මාණවල කතුවරුන් පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

1. මොනිකා රුවන්පතිරණ, ගුණදාස අමරසේකර
2. ඩබ්. ඒ අබේසිංහ, පරාක්‍රම කොඩිතුවක්කු
3. විමල් දිසානායක, ඩබ්. ඒ. අබේසිංහ
4. පරාක්‍රම කොඩිතුවක්කු, මහගමසේකර

40. මුලින් දී ඇති කොටසේ අදහස සඳහා වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.

මිනිසා ගොවිතැන ජීවනෝපාය කර ගත් තැන පටන් ආගමික ප්‍රතිපත්ති හා චාරිත්‍ර අනුසාරයෙන් ගොවිතැන පිළිබඳ සංස්කෘතික සම්ප්‍රදායන් බිහිවිය.

1. මිනිසාගේ ජීවන මාර්ගය ගොවිතැන වූ දා පටන් ආගමික පිළිවෙත් හා සිරිත්වල බලපෑමෙන් ගොවිතැන පිළිබඳ සංස්කෘතියක් බිහිවිය.
2. ආගමික ප්‍රතිපත්ති හා චාරිත්‍ර වාරිත්‍රවලට මිනිසා ගරු කිරීමට පුරුදු වූයේ ගොවිතැන ජීවනෝපාය කරගත් නව සමාජ රටාවක් බිහි වූ නිසා ය.
3. මිනිසා ගොවිතැන නව ජීවන මාර්ගය බවට පරිවර්තනය කිරීම නිසා බිහි වූ නව සංස්කෘතික සම්ප්‍රදායන් තුළ ආගමික ප්‍රතිපත්ති බිහිවිය.
4. නව සංස්කෘතික සම්ප්‍රදායන් බිහිවූයේ මිනිසා තම ජීවනෝපාය වූ ගොවිතැන සුරක්ෂිත කිරීම සඳහා ආගමික ප්‍රතිපත්ති හා චාරිත්‍ර වාරිත්‍රවලට මුල් තැනක් දීම නිසා ය.

(ලකුණු 1 × 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
මේල් மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

Learning Resource Centre
R
De Mazenod College
Kandana
59249

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
**Year End Evaluation - 2024 (2025)**

| ශ්‍රේණිය / தரம் / Grade | 10 | විෂයය / பாடம் / Subject | සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper | II | කාලය / காலம் / Time | පැය 02 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................

සැලකිය යුතුයි
- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

---

01. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. පහත දී ඇති එක් එක් වර්ගයට අයත් අක්ෂර දෙක බැගින් ලියන්න.
(අ) අඝෝෂ අල්පප්‍රාණ (ආ) ඝෝෂ මහාප්‍රාණ

ii. පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම පද දෙක පමණක් නිවැරදි කර ලියන්න.
සාහිත්‍ය සමිතියේ දී සාකච්චා කළ කරුණු ද පල වූ අදහස් ද ලේකම් විසින් වාර්තාවට ඇතුළත් කර ගැනිණි.

iii. පහත දී ඇති වචන දෙකෙහි අර්ථය පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියන්න.
(අ) නුවන (ආ) නුවණ

iv. පහත දැක්වෙන පදවල ප්‍රකෘති හා ප්‍රත්‍යය වෙන් කර දක්වන්න.
(අ) දෙවියෝ (ආ) කපයි

v. පහත දී ඇති අනුක්ත නාම පද උක්ත පද බවට පෙරළා ලියා දක්වන්න.
(අ) සියොතුන් (ආ) රජිනක

vi. පහත දැක්වෙන සන්ධි පද විසන්ධි කර ලියන්න.
(අ) ගොක්කොළ (ආ) විරෝදාර

vii. "කඩයි" යන ක්‍රියා පදය යොදා ගෙන පහත දැක්වෙන අසම්භාව්‍ය ක්‍රියා රූප දෙකක් ලියන්න.
(අ) කාලාර්ථය (ආ) අනියමාර්ථය

viii. පහත දැක්වෙන වාක්‍ය නිදොස් කර ලියන්න.
(අ) මේ දිනවල විශ්වවිද්‍යාලවලට නවක සිසුන් බඳවා ගැනෙති.
(ආ) රැස්වීමට පැමිණි දෙමවුපියන් සියල්ලෝ ම නිවෙස් බලා ගියහ.

ix. කමතේ දී සහ හේනේ දී යොදා ගත් පහත වචනවල සාමාන්‍ය ව්‍යවහාර ලියන්න.
(අ) අම්බරුවන් (ආ) හේන් ඇල්ලීම

x. පහත දැක්වෙන අදහස්වලට ගැළපෙන ප්‍රස්තාව පිරුළ බැගින් ලියන්න.
(අ) එක කරදරයක් පිට තවත් කරදරයක් පැමිණීම
(ආ) වාසි පැත්තට කවුරුත් හිතවත් ව කටයුතු කිරීම

(ලකුණු 2 × 10 = 20යි)

02. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250කට නො අඩු වනසේ රචනයක් ලියන්න. විස්තරයට මුලින් වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) නූතන සන්නිවේදන මාධ්‍යවල බලපෑම නිසා ළමයින් වෙතින් කියවීමේ පුරුද්ද ඈත්වන බව පෙනේ. කුඩා කල සිට ම දරුවන් කියවීමට යොමු කළ යුත්තේ එය සාර්ථක ජීවිතයක ජයමග වන බැවිනි. ළමයින් තුළ කියවීමේ පුරුද්ද ඇති කිරීම නිවසටත්, පාසලටත්, රජයටත් පැවරෙන විශාල වගකීමකි. කියවීම සම්පූර්ණ මිනිසකු තනයි යන කියමන සමාජ යථාර්ථයක් බවට පත් කිරීමට සියලු දෙනාගේම සාමූහික වගකීමක් විය යුතුය.

(ආ) "පෙරදිග ධාන්‍යාගාරය" නමින් අතීතයේ දී හැඳින්වුණු අපේ රටෙ හි එදා පැවති ස්වයංපෝෂිත අර්ථක්‍රමය ක්‍රමයෙන් විනාශ වී ඒ වෙනුවට යැපුම් ආර්ථිකයක් බිහි වී ඇත. එසේ වුවත් ස්වයංපෝෂිත සමාජ ආර්ථික වටපිටාවක් ගොඩ නැගීම සඳහා අවශ්‍ය සියලු දෑ රට තුළ ම තිබේ. එදා පැවති ස්වයංපෝෂිත අර්ථක්‍රමය නැවත පණගැන්වීමට අවශ්‍ය මැදිහත්වීම මගින් රටේ හෙට දවස යහපත් කර ගත හැකි වේ.

(ඉ) වර්තමානයේ ලොව සියලු රටවල් ක්‍රීඩාව කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලබයි. ක්‍රීඩාවෙන් ලැබෙන කායික නිරෝගීභාවයත් මානසික වර්ධනයත් හේතුවෙන් සමබර පෞරුෂයෙන් යුතු යහපත් පුරවැසියන් බිහිවේ. එසේ ම ක්‍රීඩා පිටියේ දී ලබා ගන්නා කායික මානසික සමබර බව සහ ශික්ෂණය එදිනෙදා ජීවිතයට බද්ධ කර ගැනීමෙන් සෞඛ්‍ය සම්පන්න ජාතියකට පෙරබිම සැකසෙයි. එබැවින් අපේ රටේ ක්‍රීඩාවේ ප්‍රවර්ධනයට තවදුරටත් අවධානය යොමුවීම අත්‍යවශ්‍ය කරුණකි.

(ඊ) අපේ පුරාතනයෝ එදා සිට ම කලාකාමී හදවත් ඇති පිරිසක් වූහ. එදා පටන් අපට උරුම වූ ජන සාහිත්‍යය ඒ සඳහා බොහෝ නිදසුන් සපයයි. විදග්ධ සාහිත්‍යය පමණ ම අගය කළ හැකි අපේ ජන සාහිත්‍යය ලාංකේය අනන්‍යතාව ලොවට හෙළි කරන කැඩපතක් බඳු ය. එබැවින් ජන සාහිත්‍යය සුරක්ෂිත කොට අනාගතයට රැගෙන යා යුතුව ඇත.

(ලකුණු 25යි)

03. පහත සඳහන් ඡේදය කියවා එහි සාරාංශය වචන 45 - 55 අතර ප්‍රමාණයකින් ලියන්න.

පොදුවේ සලකා බලන කල නවකතාව වූ කලී ගද්‍යයෙන් රචනා කරන ලද ආඛ්‍යානයක් හෙවත් ප්‍රකාශ කිරීමක්, ප්‍රබන්ධයක්, කතාන්දරයක් බව කවුරුත් පිළිගනිති. එවැනි කතාවකින් නිරූපණය විය යුත්තේ මිනිස් ජීවිතයයි. නවකතාවේ සිද්ධි මිනිස් ජීවිතයේ අප එදිනෙදා මුහුණපාන සිද්ධීන්ට බෙහෙවින් ළං විය යුතු ය. නවකතාව මිනිස් ජීවිත විවරණය කළත් සමාජයේ දක්නට ලැබෙන සැබෑ චරිත නවකතාවකින් අපට හමුනොවේ. නවකතාවක එන සියලු චරිත නවකතාකරුවා විසින් මවන ලද හෙවත් කල්පිත ඒවා ය. එහෙත් ඒ චරිත හැම අතින් ම ජන සමාජයේ දී අපට හමුවන සැබෑ මිනිසුන්ගේ චරිතවලට බෙහෙවින් ම සමීප වන්නේ ය. වෙනසකට ඇත්තේ සමාජයේ දක්නට ලැබෙන සියලු පුවත් ඒ පරිද්දෙන් ම වාර්තා නොකොට නිර්මාණකරුවා තමන්ට අවශ්‍ය කරුණු පමණක් තෝරාබේරා ගෙන කලාත්මක ලෙස ඒවා ඉදිරිපත් කිරීම ය. නවකතාකරුවා අපට ඉදිරිපත් කරන්නේ ඔහු ලත් අත්දැකීම් අනුසාරයෙන් නිර්මාණය කරන කිසියම් කතා පුවතකි. ගැඹුරු ජීවන දර්ශනයක් ද කලාත්මක බවක් ද නවකතාවක ඇතොත් එය උසස් නවකතාවක් බවට පත්වෙයි. සමහර නවකතාවලින් නිරූපණය වන්නේ මනඃකල්පිත සමාජයකි.

04. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

වත්මන් ලෝකයේ කවර අධ්‍යාපන ක්‍රමයකින් වුව ද සිදුවිය යුතු වැදගත් කාර්යයක් නම් ජනතාවගේ විවිධ වුවමනා සපුරාලනු වස් අවශ්‍ය වන උගත් හා පුහුණු මිනිස් ශ්‍රම බලය සැපයීමයි. පළමු වැනි කාර්මික විප්ලවය නිසා මිනිසාගේ කායික ශක්තිය වෙනුවට යන්ත්‍ර සූත්‍ර භාවිතය ඇරඹුණේ සමකාලීන සමාජ ව්‍යුහයේ බලවත් වෙනස්කම් ඇතිව ය. අද අප ජීවත්වන්නේ කර්මාන්ත සඳහා යොදා ගත් පැරණි බල මාධ්‍ය වෙනුවට න්‍යෂ්ටික බලය යොදා ගන්නා දෙවැනි කාර්මික විප්ලවයක් අබියස ය. කාර්මිකයාගේ ස්ථානය කාර්මික විද්‍යාඥයා විසින් ලබාගෙන ඇත. ස්වයංක්‍රීය සංකීර්ණ යන්ත්‍ර සූත්‍ර සහ ස්වයංගණක යන්ත්‍ර එදිනෙදා ජීවිතයේ පවා වැඩිවැඩියෙන් භාවිත වේ. විද්‍යාත්මක හා කාර්මික ඥානයේ කෙතරම් විශාල දියුණුවක් සමාජය තුළ ඇති වී ද යත් මනුෂ්‍ය අවශ්‍යතා විසඳීමේ දී විද්‍යාව උපයෝගී කර ගැනීම හා විද්‍යාව ඉගැන්වීම සඳහා ඕනෑම අධ්‍යාපන ක්‍රමයක් මුල් තැන දිය යුතුව ඇත. කෘෂිකාර්මික ආර්ථික ක්‍රමයක් හා ළාබාල කාර්මික ව්‍යාපාර ද ඇති රටක් වූ ශ්‍රී ලංකාවේ පාසල් විෂය මාලාව විද්‍යා අධ්‍යාපනයට සහ නව අරමුණකට යොමු කරවීමේ අවශ්‍යතාව වර්තමානයේ තරම් පෙර කිසි දිනෙක ප්‍රබල නොවීය.

i. ලෝකයේ කවර අධ්‍යාපන ක්‍රමයකින් වුවද සිදුවිය යුතු වැදගත් කාර්යය කුමක් ද?
ii. පළමු වැනි කාර්මික විප්ලවය නිසා සිදු වූ වෙනස්කම දක්වන්න.
iii. අද අප ජීවත් වන්නේ කිනම් විප්ලවයක් අබියස ද?
iv. එම විප්ලවයේ විශේෂත්වය වනුයේ කිනම් කරුණක් ද?
v. අප රටේ වර්තමානයේ ප්‍රබලම අවශ්‍යතාව ලෙස දැක්වෙන්නේ කුමක් ද?

(ලකුණු 2 × 5 = 10යි)

05. උතුරු කරඳන මහවිලත්තාව ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් වන දිනසේන විල්ගමුව, තම ප්‍රදේශයට පැමිණෙන ප්‍රධාන මාර්ගය පිළිසකර කර දෙන මෙන් ඉල්ලමින් ප්‍රාදේශීය ලේකම්වරයාට ලිපියක් යැවීමට සැලසුම් කළේය. ඒ සඳහා ඔහු සකස් කරගත් දළ සටහන පහත පරිදි වේ.

- පසුගිය වර්ෂයේ කළ ප්‍රතිසංස්කරණ කටයුතු නිසි ප්‍රමිතියකින් සිදුනොවීම.
- පසුගිය දිනවල පැවති ගංවතුර තත්ත්වය නිසා පාලම් හා බෝක්කු කැඩී යාම.
- ගමේ පවුල් 50කට පමණ තම දෛනික කටයුතු ඉටුකර ගැනීමට නොහැකිවීම.
- විශේෂයෙන් පාසල් දරුවන්ට පාසල වෙත යාමට නොහැකිවීම.

එම සංගමයේ ලේකම් ඔබ යැයි සිතා අදාළ ලිපිය වචන 100කින් පමණ ලියන්න.

නැතහොත්

ප්‍රදේශයේ ජීවත්වන දරු දැරියන්ගේ ක්‍රීඩා කුසලතා ඔප් නැංවීම සඳහා අත්‍යවශ්‍ය ක්‍රීඩා පිටියක් සකස් කර දීමට පසුගිය දා දිදුලගම රුවන් සමාජයේ සාමාජික සාමාජිකාවන් අතර පැවති මාසික රැස්වීමේ දී තීරණය විය. ඒ සඳහා පැරණි සතිපොළ ආසන්නයේ වූ වල්බිහිවී ඇති භූමියෙන් බිම් කොටසක් වෙන්කර දීමට රජයේ අනුමැතිය ලැබී ඇති බැවින් එය ශුද්ධ පවිත්‍ර කර ක්‍රීඩා පිටිය සකස් කර ගැනීමට මහා ශ්‍රමදානයක් පැවැත්වීම සුදුසු යැයි සමිතියේ විධායක සභාව විසින් තීරණය කරන ලදී. ගමේ සියලු දෙනාගේ සහාය ඊට ලබාදෙන මෙන් ඉල්ලා ප්‍රදර්ශනය කිරීමට සුදුසු දැන්වීමක් සකස් කරන්න. දිනය, වේලාව, අවශ්‍ය උපකරණ ආදිය පිළිබඳ තොරතුරු ඔබට අභිමත පරිදි යොදා ගන්න.

(ලකුණු 15යි)

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
Year End Evaluation - 2024 (2025)

59250

| ශ්‍රේණිය / தரம் / Grade | 10 | විෂයය / பாடம் / Subject | සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper | III | කාලය / காலம் / Time | පැය 02 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ............................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

සැලකිය යුතුයි.

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.
- මෙම පත්‍රය සඳහා හිමි ලකුණු ගණන 80කි.

---

01. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. "එසේ හෙයින් කල් නොයවා යහපත් නැකැතෙකින් වහා නික්මුණු මැනව"
   (අ) මේ ප්‍රකාශය කරන ලද්දේ කවරකු විසින් ද?
   (ආ) එය ශ්‍රවණය කළේ කවරෙක් ද?

ii. අනුවණකම් කළේ
ගුරුන් ගුණ සිහි නො කෙළේ
නද ඉන් නො පතළේ
අයස ම ය මුළු දියත පතළේ
   (අ) මෙහි අනුවණකම් කළ තැනැත්තාගේ නම ලියන්න.
   (ආ) මෙය උපුටාගත් මුල් කෘතිය නම් කරන්න.

iii. "කවදාවත් මිනිහෙක් ඕකෙන් එළියට එන්නෙ නෑ"
   (අ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළ අයගේ නම කුමක් ද?
   (ආ) මෙහි "ඕකෙන්" යනුවෙන් අදහස් කළේ කුමක් ද?

iv. ..............................................................................
..............................................................................
ඉවසන්නට පුළුවන් නම්
නුඹයි මගේ පුතා උතුම්
   (අ) මෙම කවියේ මුල් පේළි දෙක සම්පූර්ණ කරන්න.
   (ආ) එස්. මහින්ද හිමියන් කුඩා දරුවන් උදෙසා කළ කාව්‍ය ප්‍රබන්ධයක් නම් කරන්න.

v. (අ) එච්. එම්. කුඩලිගම කවියා සංස්කරණය කළ කවි සඟරාව කුමක් ද?
   (ආ) ඔහු "සිංහල ෂෙලී" ලෙස හැඳින්වූයේ කවර හේතුවක් නිසාදැයි දක්වන්න.

vi. මේ සියල්ල හැරදා මම
ආවෙමි වලටා
වෙසෙන ලෙසේ ඔබ පිය මා
සමිඳුන් සමගා
   (අ) මෙම ප්‍රකාශය කරනුයේ කවරකු විසින් ද?
   (ආ) එය අසා සිටියෝ කවුරුහු ද?

vii. (අ) කෘෂිකර්මාන්තය ආශ්‍රිත ජනකවි වර්ග දෙකක් නම් කරන්න.
(ආ) දෙවියන් උදෙසා පුද පූජා පැවැත්වීමේ දී ගායනා කළ කවි මොනවා ද?

viii. (අ) සිංහල ජාතක කතා පොතේ දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න.
(ආ) ගුත්තිල කාව්‍යය රචනා කරන ලෙස ආරාධනය කරන ලද්දේ කවරකු විසින් ද?

ix. (අ) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් රචනා කරන ලද නවකතාවක් නම් කරන්න.
(ආ) "විලේජ් ඉන් ද ජංගල්" නවකතාව රචිත වර්ෂය කුමක් ද?

x. (අ) පහත දැක්වෙන කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

වරද පෙනෙන තරමට වැරදුනා නොවේ
වරද ඇතැත් නිකරුණේ වැඩ කළා නොවේ
..............................................................................
..............................................................................

(ලකුණු 2 ×10 = 20යි)

02. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

i. "ශක්‍රයන් පළමුත් තමන් වහන්සේට දුන් මාණික්‍ය රත්නය ශ්‍රී හස්තයෙන් ගෙන, රජහු වැද මාලිගයෙන් බට සේක. තමන් වහන්සේ හා එක දවස උපන් යෝධයන් දහස හා සිව්රඟ සෙනඟ හා පිරිවරා........"
(අ) මෙහි දැක්වෙන මාණික්‍ය රත්නය කුමක් ද?
(ආ) මෙම අවස්ථාව පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

ii. ගුත්තිල මහ සිපී
සක්දෙව් බසින් සැතපී
මින් දිනමැයි දැපී
බමර තත පළමුවෙන් සිඳපී
(අ) අංකිත පදවල අර්ථය ලියන්න.
(ආ) මින්පසු සිදුවූ දේ සැකෙවින් දක්වන්න.

iii. "තමා ගමට යා යුතුය යන බලවත් හැඟීමත් තමා තනි වී සිටින මේ නගරයෙන් පිට ව සිය ගමට යා ගත යුතුය යන දැඩි ආශාවත් ඇට ඇතිවිය.
(අ) මෙබඳු හැඟීමක් ඇති වූ තැනැත්තිය නම් කරන්න.
(ආ) මෙහි දැක්වෙන නගරය හා ගම නම් කරන්න.

iv. "කෙසේ හෝ යා නොහැක
ඇතේ තර කර වසා
දොර ලෙනේ මහගලින
පියතුමගෙ රුදු කුමුල
බාහු යුවළින් ම මිස
බැරිය සොලවන්ට එය"
(අ) මෙහි දැක්වෙන පරිදි කෙසේ හෝ යා නොහැක යන තර්කය ඉදිරිපත් කිරීමට හේතුව කුමක් ද?
(ආ) අංකිත පදවල අර්ථය ලියන්න.

v. නහින දෙහින කාලෙට පින් කෙරුම යුත
වහින කලට කුරින් විල්වලින් එත
බහින දියෙන් දෝතක් මුත් ගතොත් ඇත
පනින රිළවුන්ට ඉණිමං කමක් නැත
(අ) මෙහි නහින දෙහින කාලය යනු කිනම් කාලයක් ද?
(ආ) මෙහි දැක්වෙන නිෂ්ඵල ක්‍රියාව කුමක් ද? (ලකුණු 4 × 5 = 20යි)

03. උම්මග්ග ජාතකයෙහි,

(අ) මහෞෂධ පඬිතුමාගේ චරිතයෙන් බෝධිසත්ත්ව ගුණාංග ද,

(ආ) කේවට්ට බමුණු චරිතයේ දුර්ගුණ ද ඉස්මතු වී පෙනේ උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15යි)

නැතහොත්

(අ) උචිත සරල බස් වහරක් යොදා ගැනීමත්

(ආ) අවස්ථාවට සුදුසු විරිත් භාවිතයත්

ගුත්තිල කාව්‍යය වඩා රසවත් වීමට හේතු වී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් සනාථ කරන්න.

(ලකුණු 15යි)

04. සිංහබාහු නාටකයේ එන

(අ) සිංහබාහු

(ආ) සිංහ සීවලි යන චරිත එකිනෙකට වෙනස් ගති ලක්ෂණ පෙන්නුම් කරයි. උදාහරණ දෙක බැගින් විමසන්න.

නැතහොත්

(අ) උපන් රටට කළ යුතු මෙහෙවර හා

(ආ) ගුණ දහමින් පෝෂිත ජීවිතයක් ගත කිරීමට මග පෙන්වීම මුනි සිරිපා සිඹිමින්නේ පද්‍ය පන්තියේ අරමුණ වේ. උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න

(ලකුණු 15යි)

05. ගැමි පරිසරයක දැකිය හැකි ක්‍රියාකාරකම් අපූරු ආකාරයෙන් දක්වමින් යහපත් සමාජයක් උදෙසා උපදෙස් දීමට ජනකවියා ගත් උත්සාහය අතිශයින් සාර්ථක වී ඇත. මෙම කියමන උදාහරණ තුනක් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10යි)

06. අජීවී වස්තූන්ට සජීවී බව ආරෝපණය කිරීමට ගත් සාර්ථක උත්සාහයක් "ගංගාවේ සංගීතය" පැදි පෙළෙන් විද්‍යමාන වේ. උදාහරණ තුනක් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10යි)

07. බැද්දේගම නව කථාවේ එන පුංචි මැණිකා එළඹෙන ජීවන අභියෝගවලට ධෛර්යවත්ව මුහුණ දුන් ආකාරය උදාහරණ තුනක් දක්වමින් සාකච්ඡා කරන්න

(ලකුණු 10යි)